**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ jd¾;dj)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/21

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 3

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2025 නොවැම්බර් මස 06 වන දින

**Author (s) of report (වා¾තාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ හිරුණි පෙරේරා

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු ආර්.එස්.එස් සපුවිද මැතිතුමා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්<br>**2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ්<br>**3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>2 චූදිත වෙනුවෙන් නීතිඥ චමින්ද අතුකෝරළ<br>3 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

1, 2 සහ 3 වන චූදිතයන් අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 3 මුදා හරින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 3 ගෙන් සාක්ෂි ලබා ගෙන නොමැති බව රජයේ නීතිඥවරිය විසින් අධිකරණයට දන්වා සිටින ලදී.

1 වන චූදිත වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා 1 වන චූදිත වෙනුවෙන් රජයේ නීතිඥවරිය විසින් පසුගිය දිනයේදී ඉදිරිපත් කරන ලද ලේඛනය සඳහා පිළිගත හැකි හා නොහැකි කරුණු ඇතුලත් කරමින් ලේඛනයක් අද දින අධිකරණයට ඉදිරිපත් කරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 54 ගෙන් මුලික සාක්ෂි විමසා සිටින ලදි.

එහිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 54 අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් ඔහු 1990 වර්ෂයේ දී උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් පොලිස් සේවයට අනුයුක්ත වූ බවත් 2019 වර්ෂය වන විට අපරාධ විමර්ශන 700ට අධික ප්‍රමාණයක් සිදු කර තිබෙන බවත් අපරාධ ස්ථාන පරීක්ෂණ අංශයට අනියුක්තව වසර 13ක් සේවය කර තිබෙන බවත් HC 3072/21 නඩුව සම්බන්ධයෙන් 2019.04.21 වන දින අපරාධ ස්ථාන පරීක්ෂණාගාර භාර ජ්‍යෙෂ්ඨ පොලිස්පතිතුමාගේ සහ එහි ස්ථානාධිපතිතුමාගේ නියෝග මත කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ විමර්ශන කටයුතු සඳහා ඊට අදාල පිටවීමේ සටහන් දමා පිටව ගිය බවත් එම ශාන්ත අන්තෝනි දේවස්ථානයේ විමර්ශන කටයුතු පැය 9.10 සිට පැය 14.45 දක්වා සිදුකළ බවත් ඉන් අනතුරුව පැය 14.45 ට අපරාධ ස්ථාන පරීක්ෂණාගාර භාර ස්ථානාධිපතිතුමාගේ නියෝග මත දෙමටගොඩ පොලිස් වසමේ මහවිල උද්‍යානයේ අංක 658/90 නිවසේ විමර්ශන කටයුතු කිරීම සඳහා පිටව ගිය බව ප්‍රකාශ කර සිටින ලදී.

එසේම අධිකරණය ඉදිරියේ තවදුරටත් සාක්ෂි දෙමින් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටියේ පැය 15.00 වන විට මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි අංක 658/90 නිවසට තමා ද ඇතුළුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය නියෝජනය කරමින් තවත් නිලධාරීන් කිහිප දෙනෙකු ගිය බවත් තමා එම ස්ථානයට ගිය අවස්ථාවේදී අපරාධ අංශයේ ස්ථානාධිපති සහ විශේෂ කාර්ය බලකායේ සෝදිසි කිරීම් අංශයේ නිලධාරීන් එම ස්ථානයට පැමිණ සිටි බවත් පැය 17.20ට එම ස්ථානයට රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතා ද පැය 17.40ට කොළඹ 2 මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා ද පැමිණි බවයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 54 අධිකරණයේ ඉදිරියේ තවදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටියේ මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසේ බෝම්බ පිපිරීම සම්බන්ධව විමර්ශන කටයුතු සඳහා ලංකාවේ ස්ථාන රැසකින් විමර්ශන නිලධාරීන් පැමිණ සිටි බවත් එසේ ඔවුන්ව සම්බන්ධ කරගනු ලැබුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඌණතාවයක් තිබූ බැවින් සහ එය ඉතාමත් වැදගත් විමර්ශන කටයුත්තක් වූ නිසාවෙන් බවයි. එමෙන්ම සාක්ෂිකරු එම මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසට යන අවස්ථාවේ එහි ඉතාමත් කලබලකාරී ස්වභාවයක් තිබූ බවත් තුවාලකරුවන් රෝහල්ගත කිරීමට කටයුතු කරමින් සිටි බවත් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සහ බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ නිලධාරීන් එම පරිශ්‍රයේ පුපුරන ද්‍රව්‍ය තිබේදැයි තවදුරටත් පරීක්ෂා කරමින් සිටි බවත් ඉන්පසු සාක්ෂිකරු නිවසට සම්බන්ධ වාහන පරීක්ෂා කිරීමේදී නිවස ඉදිරිපිට නවතා තිබූ BWM වර්ගයේ මෝටර් රථය සහ නිවසේ ගරාජයේ නවතා තිබූ මෝටර් රථයක් ඔහු පරීක්ෂාවට ලක් කළ බව පැමිණිල්ලේ සාක්ෂි අංක 54 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 54 තවදුරටත් පවසා සිටියේ එදින ඔහු ප්‍රථමයෙන්ම සිදුකළ රාජකාරිය වූයේ තුවාලකරුවන් සහ මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසේ 2වන මහලේ තිබූ මළ සිරුරු ඉවත් කිරීම බවත් එලෙස සොයා ගත් ශරීර කොටස් නම්කර ඡායාරූපගත කර පොලිතීන් කවර වලට දැමීමෙන් පසු එදිනම දෙමටගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති මගින් අදාළ අංශවලට යොමු කළ බවයි.

එමෙන්ම, මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවස මහල් 3කින් සමන්විත වන බවත් බිම් මහලේ පිහිටි සාලය **R1** ලෙසත් බිම් මහලේ කාමර 4ක් තිබූ බවත් එම කාමර **R2, R3, R4, R5** ලෙස නම් කළ බවත් **R5** ලෙස නම් කළ කාමරයේ ස්ලැබ් එකේ විශාල වශයෙන් හානි වී තිබූ බවත් **R1** සාලයේ පිපිරුම් ද්‍රව්‍ය කිසිවක් නොතිබූ බවත් මුළු නිවසේම විදුලිය ක්‍රියා විරහිත වී තිබූ බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

තවද බිම් මහලේ **R2** කාමරයේ තිබූ අල්මාරියක් තුළ තිබී **laptop** පරිඝනකයක් ද කුඩා චිප් **(pen drive)** එකක්ද දුරකථන කිහිපයක්ද මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්ගේ ජාතික හැඳුනුම්පත සහ විදේශ ගමන් බලපත්‍රය සොයා ගත් බව පැමිණිල්ලේ සාක්ෂි අංක 54 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. රජයේ නීතිඥවරිය විසින් එම **Pen drive** එක පැ2 වශයෙන් සලකුණු කරන ලදී.

තවද පැමිණිල්ලේ සාක්ෂි අංක 54 අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් 2019.04.21 දින සිදු කළ විමර්ශන කටයුතු එපමණක් බවත් ස්ථානයේ ආරක්ෂාව සඳහා දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ව යොදවා පැය 20.15ට නඩුභාණ්ඩ භාර දීම සඳහා තමා අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට ගිය බවත් එම නඩු භාණ්ඩ දේපළ කුවිතාන්සි අංක 29/2019 යටතේ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ උප පොලිස් පරීක්ෂක ප්‍රශාන්ත් හට භාර දුන් බව ප්‍රකාශ කර සිටින ලදී. රජයේ නීතිඥවරිය විසින් අදාළ දේපළ කුවිතාන්සි පැමිණිල්ලේ සාක්ෂි අංක 54 හට පෙන්වා සිටි අතර ඔහු විසින් එම දේපළ කුවිතාන්සි හඳුනාගන්නා ලදී. එමෙන්ම රජයේ නීතිඥවරිය දේපළ කුවිතාන්සි අංක 29/2019 ඇතුළත් 112 පිටුවේ 6 වන ඡේදය පැ3 වශයෙන් සලකුණු කරන ලදී. අදාළ නඩු භාණ්ඩ භාර දුන් පුද්ගලයා වන පැමිණිල්ලේ සාක්ෂි අංක 54ගේ අත්සන පැ. 3A ලෙසත් අදාළ නඩු භාණ්ඩ භාර ගත් පුද්ගලයා වන උප පොලිස් පරීක්ෂක ප්‍රශාන්ත්ගේ අත්සන පැ. 3B, අදාළ නඩු භාණ්ඩ භාර දුන් බවට සාක්ෂි වශයෙන් අත්සන් කළ නිලධාරියාගේ අත්සන පැ. 3C ලෙස සළකුණු කරන ලදී.

තවද පැමිණිල්ලේ සාක්ෂි අංක 54 අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසා සිටියේ ඔහු විසින් 2019.04.21 වන දින මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසෙන් ලබාගත් ඡායාරූප 2019.04.22 වන දින එකින් එක විශාලනය කරමින් පරීක්ෂා කළ බවයි. තවද, 2019.04.22 වන දින පැය 8.30ට නැවතත් මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසට තමා ඇතුලු නිලධාරීන් කිහිපදෙනෙකු ගිය බවත් එදින පැය 10.00ට පමණ රජයේ රස පරීක්ෂක එම ස්ථානයට පැමිණි බවත් එදින පැමිණිල්ලේ සාක්ෂි අංක 54 ඇතුළු කණ්ඩායම එම නිවසේ ඉහළ මහලේ ස්ථාන පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටින ලදී.

තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටියේ 2වන මහලේ පිහිටි සාලය **R6** ලෙසත් එම මහලේ කාමර 5ක් තිබූ බවත් එම කාමර **R7, R8, R9, R10, R11** ලෙස නම් කළ බවත් **R10** ලෙස නම් කළ කාමරයේ බෝම්බ පිපිරීම සිදුවී තිබූ බවත් එහි බිත්ති කඩා වැටී තිබූ බවත් **R9** ලෙස නම් කළ කාමරයේද බිත්ති කඩා වැටී තිබුණ බවත් ය. තවද එම නිවසේ 3වන මහල **R12** ලෙසත් එහි තිබූ තනි කාමරය **R13** ලෙසත් නම් කළ බව පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටින ලදී. තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටියේ 3වන මහලේ පිහිටි **R13** ලෙස නම් කළ කාමරයේ තිබී සුදු පැහැති ලිපිකවරයක දමා තිබූ පිටු දෙකකින් සමන්විත අර අරාබි භාෂාවෙන් ලියා තිබූ ලියුමක් ද, ජංගම දුරකථන 2ක්ද, සිම්පත් කිහිපයක් සහ සිම්පත් රඳවන කිහිපයක්ද සොයාගත් බවයි. තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටියේ 2වන මහලේ පිහිටි **R9** ලෙස නම් කළ කාමරයේ තිබී සිම්පත් කිහිපයක් සහ සිම්පත් රඳවන කිහිපයක්ද සොයා ගත් බවයි. එමෙන්ම 2වන මහලේ පිහිටි **R11** ලෙස නම් කළ කාමරයේ සුන්බුන්වලට යටවී මියගිය පොලිස් නිලධාරියෙකුගේ සිරුරක් ද ජීව උණ්ඩ 11ක් සහිත පිස්තෝලයක් ද හමුවූ බවත්, එම පිස්තෝලය මියගිය පොලිස් නිලධාරියාට නිකුත් කර තිබූ පිස්තෝලය බවට හඳුනාගත් බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. එදිනම එනම් 2019.04.22 වන දින පැය 13.30ට පැමිණිල්ලේ සාක්ෂි අංක 54 විසින් හිස්කබලක කැඩී ගිය කොටසක් පොලිස් පරීක්ෂක රණසිංහ මහතාට භාර දුන් බවට සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 54 පවසා සිටියේ බිම් මහලේ පිහිටි **R2** ලෙස නම් කළ කාමරයේ තිබී කළු පැහැති ගිනි අවියක් සොයාගත් බවත් එම ගිනි අවියේ ඇඟිලි සලකුණු බැලීමට කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂක මගින් අපරාධ පරීක්ෂණ කොට්ඨාශයට යැවූ බවයි.

රජයේ නීතිඥවරිය විසින් අධිකරණයට දැනුම් දෙන ලද්දේ මෙම මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසේ තිබී සොයා ගන්නා ලද නඩු භාණ්ඩ 500කට වැඩි ගණනක් අදාළ නිලධාරීන්ට භාරදීම සම්බන්ධව පැමිණිල්ලේ සාක්ෂි අංක 54ගෙන් සාක්ෂි ලබා ගැනීමට තිබෙන බවත් චූදිතයන් වෙනුවෙන් පෙනීසිටින නීතිඥවරුන් හට එම නඩු භාණ්ඩ අදාළ නිලධාරීන්ට භාර දී ඇති බවට ලේඛන පෙන්වා සිටිය හැකි බවත් ඔවුන් ඒවා පිළිගන්නේ නම් කාලය අපතේ නොයවා නඩු භාණ්ඩ අදාළ නිලධාරීන්ට භාරදීම සම්බන්ධව සාක්ෂි ලබා ගැනීම අවසන් කළ හැකි බවයි.

එහිදී විනිසුරුවරයා විසින් රජයේ නීතිඥවරියට දැනුම් දුන්නේ මෙම නඩුවේ අධි චෝදනාපත්‍රය ඔප්පු කිරීමට අත්‍යවශ්‍ය නඩු භාණ්ඩ සටහන් පමණක් සලකුණු කර නඩුවට ඇතුලත් කරන ලෙසටයි. එමෙන්ම එලෙස පැමිණිල්ලට අදාළ නඩුව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය නඩු භාණ්ඩ කවරේද යන්න තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා

ඉදිරියේ නඩු භාණ්ඩ පරීක්ෂා කිරීමට රජයේ නීතිඥවරියට මීළඟ සඳුදා දින එනම් 2025.11.10 වන දින පැමිණෙන මෙන් විනිසුරුවරයා විසින් දැනුම් දෙන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 54 හට ඉදිරි දිනයේදී නැවත අධිකරණයේ පෙනී සිටින ලෙසට අවවාද කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2025 දෙසැම්බර් මස 03 වන දින පස්වරු 1.30

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය jd¾;d):**